42

Article 13(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>**My No.** | ඔබේ අංකය<br>உமது இல.<br>**Your No.** | දිනය<br>திகதி<br>**Date** 2018-3-27 |
|---|---|---|

පැමිණිලිකරු : එම්.ජී නිමල්සිරි පෙරේරා මයා.
නො : 18/1. ඉහළගම.
වහැඩගම. ගම්පොල.

අගතියට පත් අය : එම්.ජී තමිදු මදුශංඛ මයා

වගඋත්තරකරුවන් : පොලිස් පරික්ෂක වීරසිංහ මයා.
කොට්ඨාශ විශේෂ දූෂණ මර්ධන අංශය.
මූලස්ථාන පොලිස් ස්ථානය.
මහනුවර.

පැමිණිලි අංකය : **HRC/K/08/16**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. තමා 25 වන වියේ පසුවන අවිවාහක පුද්ගලයෙකු වන බවත් LED විදුලි බල්බ කොටස් රැගෙන එක්ලස් කර අලවි කිරීමේ ව්‍යාපාරයක නිරත වී සිටින බවත් 2015.12.20 දින ලද ඇමතුමක් අනුව මහනුවර අම්පිටිය ප්‍රදේශයේ පුද්ගලයෙකු හට LED විදුලි බල්බ 45 ක ප්‍රමාණයක් ලබා දීම සඳහා පෙ.ව 8.45 ට නිවසින් පිටවූ බවත් 10.30 ට පමණ මහනුවර ගුඩ්ෂෙඩ් බස් නැවතුම් පළේ මහනුවර ප්‍රධාන තැපැල් කාර්යාලය ඉදිරිපිට බස් නැවතුම්පල අසල දුරකථන ඇමතුමක් ලබා ගනිමින් සිටියදී නිල ඇඳුමින් සැරසුනු පොලිස් නිලධාරියෙකු තමාට කතා කළ බවත් ඒ අනුව එතැනට යන විට සිවිල් ඇඳුමින් සැරසී සිටි තවත් පුද්ගලයින් දෙදෙනකු විසින් 'තමා මුද්ද ඇතුලේ තිබී කිසියම් දෙයක් විසිකළායැයි' චෝදනා කළ බවත් පසුව මහනුවර පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඉන් පැය භාගයකට පසුව තවත් නිලධාරියෙකු පැමිණ 'උඹ වීසි කරපු බඩු හම්බඋනා' යැයි පවසමින් තමාගේ පෞද්ගලික කාරණා විමසා ප්‍රකාශයක් ගෙන ප්‍රකාශය කියවීමට ඉඩලබා නොදී බලහත්කාරයෙන් අත්සන් ගත් බවත්ය. ඉන්පසු තමාගේ ඇඟිලි සලකුණු බලහත්කාරයෙන් ලියුම් කවරයකට අත්සන් ගත් බවත්ය. පසුව ප.ව 4.00 ට පමණ මවට දුරකථනයෙන් කතා කිරීමට අවස්ථාව ලබා දී 'තමා ලඟ කුඩු තිබී පොලීසියට අසු වූ බවට' පවසන ලෙසට දැනුම් දුන් බවත් දක්වා සිටියි. ඉන්පසු තමාගේ ජංගම දුරකථනය මුදල් පසුම්බිය හා LED විදුලි බල්බ 45 සහිත බෑගය


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165,කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2694924
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689064, 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පොලිස් භාරයට ගෙන සිරමැදිරියට දැමූ බවත් දක්වා ඇත. එදින රාත්‍රී මව හා කිහිප දෙනකු පැමිණි අතර තමා එදින පොලිස් ස්ථානයේ රඳවා සිට පසුදා අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු අධිකරණයෙන් තමා 2015.12.31 දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලද බවත් සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවයේ සැළකිරීම් :-

වගඋත්තර පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ. පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත අදාළ අය 2015.12.20 දින අත්අඩංගුවට ගන්නා ලද බවයි. පුද්ගලික තොරතුරුකරුවෙකු දුන් තොරතුරක් අනුව 2015.12.20 දින සවස 14.35 ට පමණ තමා ඇතුළු නිලධාරීන් 4 ක් විසින් මහනුවර ගුඩ්ෂෙඩ් බස් නැවතුම්පළේදී මෙම අය අත්අඩංගුවට ගෙන පැය 16.45 ට ස්ථානයට භාර දුන් බවත්. පසුව මහනුවර නගරයේ පොලිස් ස්ථානයට ආසන්නව පිහිටා ඇති 'ඉසිවර' නැමැති ෆාමසියට ගොස් ඔහු සන්තකයේ තිබූ හෙරොයින් මත් ද්‍රව්‍ය කිරා බැලූ අතර එහි හෙරොයින් 12mg ක් තිබූ බවට තහවුරු කර එම මුල රෝස පාට ග්‍රොසරියකට බහා සුදුපාට කොළයක ඔතා සැකකරුගේ වම් මහපට ඇඟිලි සළකුණු හා පොලිස් මුද්‍රා තබා නඩු බඩු දේපළ කුවිතාන්සි කර පසු බී 36838/15 අනුව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයට 2015.12.21 දින 7.40 ට ඉදිරිපත් කරන ලද බවත් ඒ අනුව අධිකරණය මගින් සැකකරුව 2015.12.31 දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලද බවත් දක්වා ඇත.

විමර්ශනය :-

පැමිණිලිකරු මූලිකවම කොමිෂන් සභාවේ අවධානය යොමු කරනුයේ කිසිදු සාධාරණ හේතුවකින් තොරව තමාව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම පිළිබඳවයි.

මෙහිදී පැමිණිලිකරුට අනුව අත්අඩංගුවට ගැනීම පෙ.ව 11.00 ට සිදුකර ඇති නමුත් වගඋත්තරකරුට අනුව ප.ව 2.35 ලෙස දැක්වේ. නමුත් වගඋත්තරකරු ස්ථානයෙන් පිටවී ඇත්තේ 2015.12.20 දින පෙ.ව 9.25 ට පමණ වන අතර පොලිස් ස්ථානයට පැමිණ ඇත්තේ ප.ව 16.20 ට බව ලේඛන වල වගඋත්තරකරු යෙදූ සටහන් තුළින් නිරීක්ෂණය වේ. එසේම පෙ.ව 9.25 සිට ප.ව 16.20 දක්වා කාලය තුළ කිසිදු අත්අඩංගුවට ගැනීමක් හෝ සෝදිසි කිරීමක් සිදුව නොමැති බවද සටහන් අධ්‍යයනයේදී නිරීක්ෂණය වේ. පැය 14.35 ට සැකකරු අත්අඩංගුවට ගෙන 16.45 ට ස්ථානයට ඉදිරිපත් කිරීම සඳහා 300m අඩු දුරකින් යුත් පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමට පැය 02 කට ආසන්න කාලයක් ගතවී ඇති බවද නිරීක්ෂණය වන අතර වැටලීමට සහභාගී වූ නිලධාරීන්ගේ සටහන් අධ්‍යයනයේදී මෙම සැකකරු අත්අඩංගුවට ගත් පසු කිසිදු වෙනත් වැටලීමකට හෝ රාජකාරියකට සහභාගී වූ බවට සටහන් වී නොමැත. ඒ අනුව වගඋත්තරකරුවන් දක්වන වේලාවන් පිළිබඳ ගැටළු මතු වේ.

එසේම සැකකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ පෞද්ගලික ඔත්තුකරුවෙකු දුන් තොරතුරක් මත බව නිලධාරීන්ගේ සටහන් අනුව හා ප්‍රකාශ අනුව දැක්වෙන නමුත් අධිකරණයට ඉදිරිපත් කර ඇති බී

වාර්තාවේ සඳහන් වන්නේ මහනුවර කටුගස්තොට ගුඩ්ෂෙඩ් බස් නැවතුම්පළ අසල සැකකටයුතු ලෙස හැසිරෙන පුද්ගලයෙකු පරීක්ෂා කිරීමට යාමේදී පොලිස් නිලධාරීන් දැක බියට පත්ව පහත් වී පලායාමට උත්සහ කිරීමේදී අල්ලා පරීක්ෂා කිරීමේදී හෙරොයින් මත්ද්‍රව්‍ය ඔහු සන්තකයේ තිබී අත්අඩංගුවට ගත් බවයි. ඒ අනුව නිලධාරීන් විසින් පොලිස් ස්ථානයේ යෙදූ සටහන් හා අධිකරණයට දැක්වූ "අත්අඩංගුවට ගත් හේතුව" පරස්පර වේ.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දුරකථනයකින් යම් පුද්ගලයෙකු සමඟ කතා කරමින් සිට ඇති බවට වගඋත්තර පාර්ශවයේ සටහන් හි දක්වා ඇති නමුත් නිලධාරීන් විසින් දුරකථනයෙන් කතා කර ඇත්තේ කා සමඟද යන්න ප්‍රශ්නකර නොමැති බවද නිරීක්ෂණය වේ. එසේම දුරකථනයේ තොරතුරු ලබාගැනීමක්ද සිදුකර නොමැති අතර මෙම අත්අඩංගුවට ගැනීමේදී දුරකථනයේ තොරතුරු ලබා ගැනීමෙන් නිලධාරීන්ගේ සැකය තහවුරු කර ගැනීමට හැකියාව තිබියදී නිලධාරීන් එසේ කටයුතු කර නොමැති බවද නිරීක්ෂණය වේ.

එසේම පැමිණිලිකරු දක්වනුයේ තමා LED බල්බ 45 ක් අලෙවි කිරීමට නිවසින් පිටවූ බවත්ය. ඒ බව සනාථ වනුයේ 2015.12.23 දින කොට්ඨාශ දූෂණ මර්ධන ඒකක තොරතුරු පොතේ 185/819 යටතේ සැකකරුගේ භාණ්ඩ යටතේ LED බල්බ 45 ක් සටහන්ව තිබීම නිසාය. ඒ තුළින් පැමිණිලිකරු දක්වා ඇති කරුණු සනාථ වන බව නිරීක්ෂණය වේ.

ඒ අනුව උක්ත නිරීක්ෂනය වන කරුණු සැළකීමේදී වගඋත්තර පාර්ශවය අපරාධ නඩුවිධාන සංග්‍රහයේ දක්වා ඇති 32(අ) ප්‍රතිපාදන මත පිහිටා කටයුතු කළේද යන්න සම්බන්ධයෙන් ගැටළු මතුවේ. ඒ අනුව අත්තනෝමතිකව හා විනිවිධභාවයකින් තොරව මෙම අයව අත්අඩංගුවට ගෙන ඇති අතරම පැමිණිලිකරුගේ නිදහස අත්තනෝමතිකව අහිමි කර ඇති බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

මෙකී සමස්ථ කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී පැමිණිල්ලේ සඳහන් එම්.ජී තම්දු මධුශංක පෙරේරා නැමැත්තා නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගෙන නඩු පැවරීම් සිදුකර ඇති බවට නිරීක්ෂණය වන අතර එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13(1) වන ව්‍යවස්ථාව පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

1. ශ්‍රී ලංකා පොලීසිය විසින් එම්.ජී තම්දු මධුශංක යන අය වෙත රු. 25,000/- ක මුදලක් වන්දියක් ලෙස ගෙවීමට කටයුතු කළ යුතුය.

2. අදාළ වගඋත්තර පාර්ශවය සම්බන්ධව දෙපාර්තමේන්තු මට්ටමින් ක්‍රියාත්මක වීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙතද යොමුකරනු ලැබේ.

2018.04.27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.